# 20 ආත්මික හා ශාරීරික පුණ්‍ය ක්‍රියා

බෙනඩික් : පියතුමෙනි, මරණයෙන් පසු සදාකාලික ජීවිතයක් තිබෙනවා ද?

පියතුමා : ඔව් පුතේ, මරණින් මතු සදාකාලික ජීවිතයක් තිබෙනවා.

බෙනඩික් : පියතුමෙනි, සදාකාලික ජීවිතය ලබා ගැනීමට අප කළ යුතු දේවල් මොනවා ද?

පියතුමා : පුතේ, අසල්වැසියාට ප්‍රේම කළ යුතු ය; ඒ සඳහා පුණ්‍ය ක්‍රියාවල අප නිරත විය යුතු යි.

බෙනඩික් : පියතුමෙනි, පුණ්‍ය ක්‍රියා කියන්නේ මොනවාට ද?

පියතුමා : පුතා, මෙම ශුද්ධ ලියවිලි පාඨවලට හොඳින් සවන් දෙන්න. එවිට ඔබට තේරේවි.

මනුෂ්‍ය-පුත්‍රයාණන් සියලු දූතයන් පිරිවරාගෙන තේජශ්‍රීයෙන් පැමිණෙන කල, එතුමාණෝ තමන්ගේ මහිමාන්විත සිංහාසනයේ වැඩහිඳින සේක. එවිට සියලු ජාතීහු උන් වහන්සේ අබිමුවෙහි රැස් කරනු ලබන්නෝ ය. එඬේරකු, එළුවන්ගෙන් බැටළුවන් වෙන් කරන්නාක් මෙන් උන් වහන්සේ ද ඔවුන් වෙන් කොට, බැටළුවන් සිය දකුණු පැත්තෙහි ද එළුවන් වම් පැත්තෙහි ද සිටුවන සේක. එවිට රජ්ජුරුවන් වහන්සේ සිය දකුණු පසෙහි සිටින්නන්ට කතා කොට, "මාගේ පියාණන්ගෙන් ආශිර්වාද ලද්දෙනි, එන්න, ලෝකය පටන්ගැන්මේ සිට ඔබට සූදානම් කර තිබෙන රාජ්‍යය උරුම කර ගන්න. මන්ද, මම සාගිනි ව සිටියෙමි; ඔබ මට කන්න දුන්නහු ය. පිපාසා වී සිටියෙමි; ඔබ මට බොන්න දුන්නහු ය. ආගන්තුක ව සිටියෙමි; ඔබ මා ගෙදරට පිළිගත්තහු ය. වස්ත්‍ර නැති ව සිටියෙමි; ඔබ මට වස්ත්‍ර දුන්නහු ය. රෝගාතුර ව සිටියෙමි; ඔබ මා බලාගත්තහු ය. හිරගෙදර සිටියෙමි; ඔබ මා බලන්න ආවාහු ය"යි වදාරන සේක. එකල දැහැමියන් උත්තර දෙමින්, "ස්වාමීනි, කවර කලෙක ඔබ වහන්සේ සාගිනි ව සිටිය දී අපි ඔබට කෑම දුනිමු ද? පිපාසා වී සිටිය දී බොන්න දුනිමු ද? කවර කලෙක ඔබ වහන්සේ ආගන්තුක ව සිටිය දී ගෙදරට පිළිගතිමු ද? නොහොත් වස්ත්‍ර නැති ව සිටිය දී ඇඳුම් දුනිමු ද? කවර කලෙක ඔබ රෝගාතුර ව හෝ හිරගෙදර හෝ සිටිය දී ඔබ බලන්න ආවෙමු ද"යි කියනු ඇත. එවිට රජ්ජුරුවන් වහන්සේ උත්තර දෙමින්, "සැබැවින් ම මම ඔබට කියමි, මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා ම සුළු තැනැත්තාට වුව ද ඔබ එසේ කළා නම් එය කළේ මට ය"යි වදාරන සේක. එවිට උන් වහන්සේ වම් පසෙහි සිටින්නන්ට



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

කතා කොට, "ශාප ලද්දෙනි, මා වෙතින් ඉවත් වී යක්ෂයාට ද ඔහුගේ දූතයන්ට ද සූදානම් කර තිබෙන සදාතන ගින්නට යන්න. මන්ද, මම සාගිනි වී සිටියෙමි; ඔබ මට කන්න නුදුන්නාහු ය. පිපාස වී සිටියෙමි; ඔබ මට බොන්න නුදුන්නාහු ය. ආගන්තුක ව සිටියෙමි; ඔබ මා ගෙදරට නොපිළිගත්තාහු ය. වස්ත්‍ර නැති ව සිටියෙමි; ඔබ මට වස්ත්‍ර නුදුන්නහු ය. රෝගාතුර ව සිටියෙමි; හිරගෙදර ද සිටියෙමි; ඔබ මා බලන්නන ආවේ නැතැ"යි වදාරන සේක. එවිට ඔවුන් උත්තර දෙමින්, "ස්වාමීනි, කවර කලෙක ඔබ සාගිනි ව හෝ පිපාසා වී හෝ ආගන්තුක ව හෝ වස්ත්‍ර නැති ව හෝ රෝගාතුර ව හෝ හිරගෙදර හෝ සිටිනු දැක අපි ඔබ වහන්සේට උපස්ථාන නොකෙළෙමු දැ"යි අසනු ඇත. එවිට උන් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, "සැබැවින් ම මම ඔබට කියමි, මොවුන්ගෙන් ඉතා ම සුළු තැනැත්තාට වුව ද එසේ නොකළා නම් එය නොකළේ මට ය"යි වදරණ සේක.

(මතෙව් 25:31-45)

සාගිනි වූවන්ට ආහාර ද නිර්වස්ත්‍ර වූවන්ට වස්ත්‍ර ද දුනිමි. නිනිවය නුවර ප්‍රාකාරවලින් පිටත දමන ලද මාගේ රට වැසියන්ගේ මෘත ශරීර මා දුටු විට, මම ඒවා භූමදාන කෙළෙමි.

(තෝබිත් 1:17)

ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේ දී සියලු දෙනා විනිශ්චයට ලක්වන බව ඉහත ශුද්ධ ලියවිලි පාඨය අපට පෙන්වා දෙයි. එලෙස අප විනිශ්චයට ලක්කරන මිනුම් දණ්ඩ වන්නේ පුණ්‍ය ක්‍රියා ය. කතෝලිකයන් වශයෙන් සැම දේව පනතක් ම රක්ෂා කළ යුතු අතර එමගින් පමණක් සියල්ල සම්පූර්ණ නොවේ. දේව රාජ්‍යය හිමිකර ගැනීමට නම් ශාරීරික හා ආත්මික පුණ්‍ය ක්‍රියා ද ඉටු කළ යුතු ය.

ශාරීරික පුණ්‍ය ක්‍රියා කරනු ලබන්නේ කිසියම් පුද්ගලයකුගේ ශාරීරික යහපත සඳහා ය. ශාරීරික පුණ්‍ය ක්‍රියා 7කි:

1. සාගිනි වූවනට ආහාර දීම
2. පිපාස වූවනට පානය දීම
3. වස්ත්‍ර නැති අයට වස්ත්‍ර දීම
4. ආගන්තුකයනට නවාතැන් දීම
5. රෝගීන් බැලීමට යාම
6. වහලුන් නිදහස් කිරීම
7. මළවුන් වැළලීම

ආත්මික පුණ්‍ය ක්‍රියා කරනු ලබන්නේ කිසියම් පුද්ගලයකුගේ ආත්මික යහපත සඳහා ය. ආත්මික පුණ්‍ය ක්‍රියා 7කි:

1. පව්කරුවන් පාපයෙන් හරවා ගැනීම
2. අඥානයනට ඉගැන්වීම
3. සැක ඇති අයට දැනුමැතිකම් දීම
4. දුකින් පෙළෙන්නන් සැනසීම
5. නින්දා අපහාස ඉවසීමෙන් දරා ගැනීම
6. වැරැදි කමා කිරීම
7. ජීවතුන් හා මළවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

මිනිසාගේ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීම ආත්මික පුණ්‍ය ක්‍රියා මගින් සිදු වේ. අපගේ දැනුම, හැකියා, දක්ෂතා, සිතුම් පැතුම්, අදහස්, උදහස් යනාදිය අන්‍යයන් සමග බෙදා හදා ගැනීමෙන් අපට ඔවුන් පොහොසත් කළ හැකි ය.

ආත්මික පුණ්‍ය ක්‍රියා, ශාරීරික පුණ්‍ය ක්‍රියාවලට වඩා උසස් ය. එහෙත් සියලු පුණ්‍ය ක්‍රියා අප කළ යුතු ය. කිතුනු දයාව හැඟුමකට හෝ සංවේගයකට හෝ සීමා වූවක් නොවේ. දයාව ක්‍රියාවට පරිවර්තනය විය යුතු ය. ඒ පිළිබඳ ව ජාකොබ් තුමා මෙසේ කියයි;

> යම් සහෝදරයකු හෝ සහෝදරියක හෝ ඇඳුම් නැති ව, දිනපතා කෑම නැති ව සිටිය දී, ඔබගෙන් යමෙක් ඔවුන්ගේ ශාරීරික අවශ්‍යතා සපයා නොදී: ඔබට දෙවි පිහිටයි, උණුසුමට ඇඳ පැළඳ, කා බී සතුටු වන්නැ යි ඔවුන්ට කියන්නේ නම්, එයින් මොන යහපතක් ද?
>
> (ජාකොබ් 2:15-16)

ශාරීරික පුණ්‍ය ක්‍රියාවලින් අපේක්ෂා කරන්නේ මනුෂ්‍යයාගේ මූලික අවශ්‍යතා සම්පූර්ණත්වයට පත් කිරීම ය. ආහාරපාන, වස්ත්‍ර, වාසස්ථාන, ලෙඩ දුකේ දී සහනය ආදිය මනුෂ්‍යයාට මනුෂ්‍යයකු ලෙස ජීවත් වීමට අත්‍යවශ්‍ය ය. ක්‍රිස්තුන් වහන්සේ මෙයින් අපට දෙන පණිවිඩය වන්නේ, යමෙකුගේ සදාකාලික ඉරණම තීරණය වන්නේ, අප කුසගින්නෙන් පෙළෙන්නන්ට, අනාථ වූවන්ට, සරණාගතයින්ට, රෝගීන්ට හා සිරකරුවන්ට පිහිට වී ද නැද් ද යන්න පදනම් කර ගෙන ය. එවැනි අයට උපකාර කරන්නා, ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරන්නා මුළු මානව වර්ගයාගේ රජාණන් වන ක්‍රිස්තුන් වහන්සේ හට සේවය කරන්නකු වේ.

**ක්‍රියාකාරකම**

1. "ස්වර්ගීය සම්පත ලබා ගැනීමට පුණ්‍ය ක්‍රියාවන්හි නිසි ලෙස නිරත විය යුතු ය" යන මැයෙන් ළමා ප්‍රදීපයට ලිපියක් නිර්මාණය කරන්න.
2. ඔබේ යහපතට අකුල් හෙළන හෝ ඔබට පීඩා කරන පුද්ගලයන් හෝ වෙනුවෙන් කළ යුතු ආත්මික පුණ්‍ය ක්‍රියා **දෙකක්** විස්තර කරන්න.
3. මෑත කාලයේ යම් කිසි ස්වභාවික විපතකින් පීඩාවට පත් වූ අය වෙනුවෙන් ඔබ කළ හෝ කළ හැකි ව තිබුණු පුණ්‍ය ක්‍රියා නම් කර ඒවා කළ හෝ කළ හැකි ව තිබූ ආකාර පිළිබඳ ව වචන 100කින් පමණ විස්තර කරන්න.



**ජීවිතයට බිඳක්**

***දිනපතා ශාරීරික හා ආත්මික පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වීමට උත්සාහ කරන්න. සවස යැදුමේ දී කළ පුණ්‍ය ගැන දෙවියන් වහන්සේට තුති පුදන්න.***